සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

## ආර්ථික විද්‍යාව I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න. (පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)**

01. ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ආර්ථික ප්‍රශ්නයක් වන හිඟකම පිළිබඳ ප්‍රශ්නය
    1. මිල ගණන් පහළ දැමීමට හැකි නම් මුළුමනින්ම තුරන් කළ හැකිය.
    2. මිශ්‍ර ආර්ථික ක්‍රමයක් පවත්නා රටවල දක්නට ලැබේ.
    3. දැනට පැවතියත් ආර්ථික වෘද්ධිය තුළින් විසඳාගත හැකිය.
    4. පැනගනින්නේ පවත්නා සම්පත්වලින් මිනිස් වුවමනා සපුරාලිය නොහැකි බැවිනි.
    5. යන්නෙන් අදහස් වන්නේ සමහර අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟ බවයි.

02. ආර්ථික භාණ්ඩයක් හඳුනා ගැනීමට පහත ලක්ෂණවලින් කවරක් වඩා යෝග්‍ය වන්නේද?
    1. නිෂ්පාදනයේදී සම්පත් උපයෝජනය නොකෙරෙන භාණ්ඩයකි.
    2. නිෂ්පාදනයේදී ආවස්ථික පිරිවැයක් හට ගැනීම.
    3. ශුන්‍ය මිලකදී වුවද ලබාගත හැකිවීම.
    4. නිෂ්පාදනයේදී ලාභයක් ජනනය කෙරෙන භාණ්ඩයක් වීම.
    5. තරඟකාරී ලෙස සපයනු ලබන භාණ්ඩයකි.

03. කිසියම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ලක්ෂ්‍යවල,
    1. පවත්නා සියලුම සම්පත් සම්පූර්ණයෙන් උපයෝජනය වේ.
    2. තාක්ෂණය වෙනස් වෙමින් පවතී.
    3. නිෂ්පාදනයේ අකාර්යක්ෂමතා පිළිබිඹු කරයි.
    4. නිෂ්පාදන සම්පත් පූර්ණ ලෙස උපයෝජනය නොවේ.
    5. අනෙක් භාණ්ඩයේ නිෂ්පාදනය අඩු නොකොට කිසියම් භාණ්ඩයක් වැඩිපුර නිපදවිය හැක.

04. කිසියම් ආර්ථිකයක් පූර්ණසේවා නියුක්තියේ පවතින බව උපකල්පනය කරන්න. මෙම ආර්ථිකයේ ප්‍රාග්ධන ආයෝජනය ඉහළ නැංවීමේ ආවස්ථික පිරිවැය වන්නේ,
    1. ආදායම පහළ වැටීමයි.
    2. පරිභෝජනය පහළ වැටීමයි.
    3. නිමැවුම පහළ වැටීමයි.
    4. ඉතුරුම් ඉහළ නැගීමයි.
    5. පොලී අනුපාතය ඉහළ නැගීමයි.

05. වෙළඳපොල ආර්ථිකයක මිල ක්‍රමය මගින් මුදුන් පමුණුවාගත නොහැක්කේ මින් කවරක්ද?
    1. විකල්ප ප්‍රයෝජන අතර හිඟ සම්පත් බෙදාගැනීමයි.
    2. අධි සැපයුම හා අධි ඉල්ලුම ඉවත් කිරීම.
    3. ඉල්ලුම වෙනස් වීමට සැපයුම ප්‍රතිචාර දැක්වීම.
    4. සාධාරණ අන්දමට සියලු භාණ්ඩ බෙදාහැරීම තහවුරු කිරීම.
    5. පාරිභෝගික වරණය වෙනස්වීම පිළිබඳ සංඥාවක් ලබාදීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


06. නිෂ්පාදන හැකියා මායිම සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ ඇතුරෙන් ඔබට එකඟ විය හැකි ප්‍රකාශය තෝරන්න.
   1. නිෂ්පාදන හැකියා මායිමක බෑවුමෙන් දැක්වෙන්නේ වැඩෙන ආවස්ථික පිරිවැයයි.
   2. මායිම මත පිහිටි ලක්ෂ්‍යවලින් දැක්වෙන්නේ සම්පත් අධි භාවිතයයි.
   3. පූර්ණ ශ්‍රම සේවා නියුක්තියක් පවතීනම් නිෂ්පාදන ලක්ෂ්‍ය සැමවිටම පිහිටන්නේ මායිම මතය.
   4. ශ්‍රම සේවා වියුක්තියක් පවතී නම් නිෂ්පාදන ලක්ෂ්‍ය පිහිටන්නේ වක්‍රයට දකුණු පසිනි.
   5. මායිම දකුණට විතැන්විය හැක්කේ නිෂ්පාදන සාධක ප්‍රමාණය හා ඵලදායීතාවය වැඩිවුවහොත්ය.

07. සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය වමට විතැන්විය හැක්කේ,
   1. අනුපූරක භාණ්ඩයක මිල වැඩි වීමකදීය.
   2. අනුපූරක භාණ්ඩ සඳහා කරනු ලබන ප්‍රචාරක වියදම් වැඩිවීමකදීය.
   3. භාණ්ඩ සඳහා ඇති වරණය වැඩි වීමකදීය.
   4. පරිභෝගිකයාගේ ආදායම වැඩි වීමකදීය.
   5. සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වීමකදීය.

08. කිසියම් භාණ්ඩයක මිල වෙනස් වුවද මුළු අයභාරය කිසිඳු වෙනසක් පෙන්නුම් නොකෙරේ. මෙසේ වීමට නම්,
   1. භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ශුන්‍ය නම්‍ය විය යුතුය.
   2. භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ඒකීය නම්‍ය විය යුතුය.
   3. එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම අනම්‍ය විය යුතුය.
   4. එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම නම්‍ය විය යුතුය.
   5. මිල වෙනස්වීම කෙරෙහි පාරිභෝගිකයා දැඩි ප්‍රතිචාරයක් දැක්විය යුතුය.

09. තරඟකාරී වෙළඳපලක අලෙවි වන එක්තරා භාණ්ඩයක සැපයුම් වක්‍රය වමට විතැන්වීමට බලපාන කරුණක් හඳුනාගන්න.
   1. භාණ්ඩයෙහි මිල ඉහළ යාම.
   2. භාණ්ඩයෙහි මිල පහළ යාම.
   3. නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
   4. නිෂ්පාදන පිරිවැය පහළ යාම.
   5. භාණ්ඩයට ඇති ඉල්ලුම අඩුවීම.

10. කිසියම් භාණ්ඩයක සැපයුම් වක්‍රයක් පහත රූප සටහනෙන් දැක්වේ.




මෙම සැපයුම් වක්‍රය මත සැපයුමේ මිල නම්‍යතාව නිවැරදිව දැක්වෙන ප්‍රකාශය තොරන්න.

   1. නම්‍යතාව ඍණ අගයක් ගනු ලබන අතර නිමැවුම් වැඩිවත්ම අගය අඩු වේ.
   2. එකට වඩා වැඩි අගයක් ගනු ලබන අතර නිමැවුම් වැඩිවත්ම අගය අඩු වේ.
   3. එකට වඩා වැඩි අගයක් ගනු බලන අතර නිමැවුම් වැඩිවත්ම අගය වැඩි වේ.
   4. සෑම නිමැවුම් ප්‍රමාණයකදීම ස්ථාවර සහ එකට වැඩි අගයක් ගනී.
   5. සෑම නිමැවුම් ප්‍රමාණයකදීම ස්ථාවර සහ එකට අඩු අගයක් ගනී.

11. පාරිභෝගික අතිරික්තය ශුන්‍ය අගයක් ගනු ලබන්නේ කුමන අවස්ථාවකදී ද?
   1. සැපයුම පූර්ණ අනම්‍යතාවයෙන් යුක්ත වන විටකදීය.
   2. සැපයුම පූර්ණ නම්‍යවන විටදීය.
   3. ඉල්ලුම පූර්ණ අනම්‍ය වන විටදීය.
   4. ඉල්ලුම පූර්ණ නම්‍ය වන විටදීය.
   5. ඉල්ලුමේ නම්‍යතාව සැපයුම් නම්‍යතාට වඩා ඉහළ අගයක් වන විටදීය.

12. කිසියම් භාණ්ඩයක වෙළඳපල ඉල්ලුම් හා සැපයුම් වක්‍රවලට අදාළ සමීකරණ පහත පරිදි වේ යැයි සිතන්න.

$$Qd = 80-2P \qquad Qs= -20+3P$$

මෙම වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන් සමතුලිත මිල හා ප්‍රමාණය පිළිවෙලින්,
   1. රුපියල් 40 සහ ඒකක 120 කි.
   2. රුපියල් 60 සහ ඒකක 15 කි.
   3. රුපියල් 20 සහ ඒකක 50 කි.
   4. රුපියල් 10 සහ ඒකක 60 කි.
   5. රුපියල් 20 සහ ඒකක 40 කි.

IWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

13. තරඟකාරී වෙළෙඳපොළක අලෙවි කරන භාණ්ඩයකට අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණවලින් නිරූපණය වේ යැයි සලකන්න.

$Qd = 160-4P$ $\qquad$ $Qs = -20+2P$

වෙළඳපොළ සමතුලිත වන විට මිල ඉල්ලුම් නම්‍යතාවය

1. -2.4 කි. 2. -2.6 කි. 3. -2.8 කි. 4. -3.0 කි. 5. -5.3 කි.

14. සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කරමින් පනවනු ලබන උපරිම මිල ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් වන්නේ වෙළඳපොළෙහි,

1. අධි සැපයුමක් හට ගැනීමයි.
2. අධි ඉල්ලුමක් හට ගැනීමයි.
3. සමතුලිත මිලක් ඇති වීමයි.
4. සැපයුම වැඩි වීමයි.
5. ඉල්ලුම අඩු වීමයි.


15. පැපොල් වෙළඳපොළක ඉල්ලුම් හා සැපයුම් දත්ත වගගුවක් පහත දැක්වේ.

| **මිල (රුපියල්)** | **ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)** | **සැපයුම් ප්‍රමාණය (ඒකක)** |
|---|---|---|
| 30 | 11 | 22 |
| 25 | 12 | 19 |
| 20 | 13 | 17 |
| 15 | 15 | 15 |
| 10 | 17 | 13 |
| 05 | 20 | 11 |

රජය පැපොල් නිෂ්පාදකයින්ට රුපියල් 10 සහනාධාරයක් ලබා දුන්නේ නම් සමතුලිත මිල වන්නේ

1. රු. 5 කි 2. රු.10 කි 3. රු. 20 කි 4. රු. 25 කි 5. රු. 15 කි

16. පහත දැක්වෙන රූප සටහන මගින් කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති තරඟකාරී වෙළෙඳපොළක් නිරූපණය කරයි.





වෙළෙඳපොළ නිෂ්පාදකයන් දිරිගැන්වීමට නිෂ්පාදන සහනාධාරයක් ලබාදුන්නේ නම් නිෂ්පාදන අතිරික්තයේ වැඩිවීම වන්නේ

1. රුපියල් 3000 යි
2. රුපියල් 2000 යි
3. රුපියල් 4400 යි
4. රුපියල් 500 යි
5. රුපියල් 550 යි

17. උපරිම මිල සීමා නියම කිරීම නිසා ඇතිවන ප්‍රතිවිපාකයක් **නොවන්නේ,**

1. අධි ඉල්ලුම නිසා වෙළඳපොළ භාණ්ඩ හිඟයක් ඇති වීම.
2. නීති විරෝධී කළුකඩ මිල යටතේ භාණ්ඩ අලෙවිකිරීමට තැත් කිරීම.
3. කළු කඩ මිල නිසා පෙර තිබූ සමතුලිත මිලටත් වඩා පහළ මිලකට භාණ්ඩ අලෙවි කිරීම.
4. නිෂ්පාදකයාගේ ලාභ සීමා වන නිසා එම නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන සීමා වීම.
5. පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයට අයහපත් බලපෑමක් ඇති වී සමාජ ශුභ සාධනයට හානි සිදුවීම.

18. පහත දී ඇති රූප සටහන අනුව වෙළඳපොළ සමතුලිත වන විට නිෂ්පාදන අතිරික්තය වන්නේ,





1. රු. 200 කි
2. රු. 400 කි
3. රු. 350 කි
4. රු. 300 කි
5. රු. 600 කි



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

19.




ඉහත රූප සටහනේ දැක්වෙන භාණ්ඩය මත රු. 4 ක විශේෂිත ඒකක බද්දක් පැනවුවහොත් බද්දෙන් පසු

| | **පාරිභෝගික අතිරික්තය (රු)** | **නිෂ්පාදන අතිරික්තය (රු)** |
|---|---|---|
| 1. | 400 | 800 |
| 2. | 400 | 1200 |
| 3. | 1200 | 400 |
| 4. | 400 | 400 |
| 5. | 800 | 80 |

20. සැපයුම් රේඛාව QS = -40 + 3P ගන්නා භාණ්ඩයක් මත රු. 5 ක ඒකක සහනාධාරයක් ලබාදුන් විට සැපයුම් වක්‍රය
    1. QS = -55 + 3P
    2. QS = -40 + 15P
    3. QS = 40-15P
    4. QS = 55 - 3P
    5. QS = -25 + 3P

21. නිෂ්පාදන ආයතනයක මුළු අයභාරයෙන් ඍජු පිරිවැය ආවරණය කරගත් පසු තව දුරටත් අතිරික්තයක් පවතී නම්, ආයතනය
    1. ප්‍රාමාණික ලාභ උපයයි.
    2. ආර්ථික ලාභ උපයයි.
    3. ගණකාධිකරණ ලාභ උපයයි.
    4. ආර්ථික ලාභ ශුන්‍ය වේ.
    5. ප්‍රාමාතික ලාභ ශුන්‍ය වේ.

22. දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක් සම්බන්ධයෙන් වලංගු **නොවන** ප්‍රකාශය කුමක් ද?
    1. ආයතනයේ නිෂ්පාදන පරිමාව ප්‍රසාරණය වේ.
    2. නිමවුම හැසිරෙන ආකාරය පරිමාණානුකූල ඵල මගින් නිරූපණය වේ.
    3. සාධක සංයෝග අනුපාත ස්ථාවරව පවතී.
    4. අඩුවන පරමාණුකූල ඵල පවතින විට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ නගී.
    5. මුළු පිරිවැය මුළු විචල්‍ය පිරිවැයට සමාන වේ.

23. ආයතනයක් ආර්ථික ලාභය ගණනයේදී ආවස්ථික පිරිවැයේ කොටසක් සේ **නොසලකන්නේ** කුමක්ද?
    1. ස්ථාවර පිරිවැය
    2. විචල්‍ය පිරිවැය
    3. මූල්‍ය පිරිවැය
    4. ආරෝපිත පිරිවැය
    5. යටකළ පිරිවැය

24. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වලංගු **නොවන** ප්‍රකාශය කුමක් ද?
    1. කෙටිකාලීන පිරිවැය වක්‍ර හීනවන ඵලදා නීතියේ පිළිඹිබුවකි.
    2. විචල්‍ය සාධකයේ මිල නොවෙනස්ව තබියදී විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව ඉහළ යන විට ආන්තික පිරිවැය පහත වැටේ.
    3. ආන්තික ඵලදාව හීනවීමට පටන්ගන්නා විට ආන්තින පිරිවැය ඉහළ යැමට පටන් ගනී.
    4. කෙටිකාලයේදී ආන්තික ඵලදාව උපරිම වනවිට ආන්තික පිරිවැය උපරිම වේ.
    5. කෙටි කාලීන ආන්තික පිරිවැය වක්‍රය ආන්තික ඵලදාව වක්‍රයේ ප්‍රතිබිම්භයක් වේ.

25. ආයතනයක පරිමාණානුකූල පිරිමැසුම්
    1. හැමවිටම නිෂ්ප්‍රාමාණික ලාභ වැඩිවීමට හේතුවේ.
    2. සාමාන්‍ය පිරිවැය වැඩි වීමට හේතු වේ.
    3. බහුජාතික සමාගම්වලට ප්‍රතිලාභ ගෙනදීමට හේතුවේ.
    4. නිමැවුමේ සමානුපාතික වැඩිවීමට හේතුවේ.
    5. දිගුකාලීන සාමාන්‍ය පිරිවැය පහළ වැටීමට හේතු වේ.




මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP_EXAM

26. කෙටිකාලීන මුළු ස්ථාවර පිරිවැය යන්නට ඇතුළත් **නොකරනුයේ**
   1. බලපත්‍ර ගාස්තු
   2. නුපුහුණු ශ්‍රමිකයන්ට ගෙවන වැටුප්
   3. රක්ෂණ වාරික
   4. ප්‍රාග්ධන සඳහා පොළී ගෙවීම
   5. කළමණාකරුවන්ට ගෙවන වැටුප

27. කිසියම් නිෂ්පාදන සාධකයක සංක්‍රාම ඉපයීම එම සාධකයේ වර්තමාන භාවිතයේ,
   1. ආර්ථික බදු කුලියට සමාන වේ.
   2. වෙළඳපොළ මිලට සමාන වේ.
   3. ආවස්ථික පිරිවැයට සමාන වේ.
   4. මුළු අයභාරයට සමාන වේ.
   5. ආන්තික අයභාරයට සමාන වේ.

28. එක්තරා ආර්ථිකයක මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ සැබෑ වටිනාකම කාලයත් සමග වෙනස් වී ඇති ආකාරය පහත රූප සටහන පෙන්නුම් කරයි.




   මෙම ආර්ථිකයේ සැබෑ නිමැවුම A සිට B දක්වා ගමන් කරන විට,
   1. ප්‍රශස්ත නිමැවුම අත්කර ගන්නා අතර ධන නිමැවුම් පරතරයක් හටගනී.
   2. විරැකියාව ඉහළ නගින අතර නිමැවුම් ප්‍රසාරණය වේ.
   3. නිමැවුම ප්‍රසාරණය වන අතර සෘණ නිමැවුම් පරතරයක් හටගනී
   4. ධන නිමැවුම් පරතරයක් සමග සේවා නියුක්තිය පහළ යයි.
   5. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම සමග සේවා වියුක්තිය අඩු වේ.

29. ශ්‍රී ලංකාවේ නේවාසික ඒකකයක් **නොවන්නේ** මින් කවරක්ද?
   1. නේපාලයේ විශ්වවිද්‍යාලයක වසර 5ක කාලයක් අධ්‍යාපනය කටයුතු වල නිරතව සිටින ශ්‍රී ලංකික ශිෂ්‍යයන්.
   2. ඇමරිකාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික කාර්‍ය මණ්ඩලය.
   3. ඉතාලියේ රෝම නගරයේ පිහිටි ශ්‍රී ලංකාවට අයත් ලංකා බැංකු ශාඛාවේ කටයුතු කරන ශ්‍රී ලාංකික කාර්යමණ්ඩලය
   4. ජයවර්ධනපුර රෝහලේ දීර්ඝකාලීනව සේවය කරන සිංගප්පූරු වෛද්‍යවරයෙක්.
   5. ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දීය තානාපති කාර්යාලයේ සේවය කරන ශ්‍රී ලාංකිකයන්.

30. ඇඟලුම් නිෂ්පාදකයෙක් රු. 10500 ක් වටිනා ආනයනික රෙදිපිළි හා උපාංග මිලදී ගෙන රු 15000 ක් වටිනා නිමි ඇඳුම් නිපදවා පාරිභෝගිකයන්ට අලෙවි කරයි. මෙම ක්‍රියාවලියේදී නිමි ඇඳුම් නිපදවන්නා දළ දේශීය නිෂ්පාදිතයට සිදුකරනු ලබන දායකත්වය කොපමණද?
   1. රු. 20 500  2. රු. 25 500  3. රු. 15 000  4. රු. 10 500  5. රු. 4500

31. වර්තමානයේ (2019 වර්ෂයේ) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම,
   1. ඇමරිකානු ඩොලර් බිලියන 88 කි.
   2. ඇමරිකානු ඩොලර් බිලියන 84 කි.
   3. ඇමරිකානු ඩොලර් බිලියන 82 කි.
   4. ඇමරිකානු ඩොලර් බිලියන 80 කි.
   5. ඇමරිකානු ඩොලර් බිලියන 76 කි.

32. මූලික මිල යටතේ දළ දේශීය නිෂ්පාදනය ලබා ගැනීම සඳහා, අදාළ **නිවරදි** ගැළපීම කවරේද?
   1. වැටුප් + බදුකුලී + පොළී + ලාභ
   2. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම්
   3. වැටුප් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම් + නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු
   4. පෞද්ගලික පරිභෝජන වියදම + පොදු පරිභෝජන වියදම + දළ දේශීය ආයෝජනය + ශුද්ධ අපනයන + නිෂ්පාදන මත වෙනත් ශුද්ධ බදු
   5. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම් + නිෂ්පාදිතය මත ශුද්ධ බදු

AMP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

33. එක්තරා ආර්ථිකයක කිසියම් වර්ෂයක නාමික ජාතික ආදායම 8% කින්ද, මිල මට්ටම 5% කින්ද, ජනගහනය 4% කින්ද ඉහළ ගියේ යැයි සලකන්න. මෙම තොරතුරු වලට අනුව අදාළ වර්ෂයේදී මෙම ආර්ථිකය සම්බන්ධයෙන් පහත සඳහන් කවර සංයෝජනයක් නිවැරදි වේද?

| | **මූර්ත ජාතික ආදායම** | **ප්‍රතිශීර්ෂ මූර්ත ජාතික ආදායම** |
|---|---|---|
| 1. | වැඩි වේ | අඩු වේ |
| 2. | අඩු වේ | අඩු වේ |
| 3. | වැඩි වේ | වැඩි වේ |
| 4. | අඩු වේ | වැඩි වේ |
| 5. | ස්ථාවර වේ | අඩු වේ |

34. පහත වගුවෙහි දැක්වෙන දත්තවලට අනුව මෙම ආර්ථිකයේ ජාතික ඉතුරුම්වල වටිනාකම කොපමණද?

| **අයිතමය** | **වටිනාකම (රුපි. බිලි)** |
|---|---|
| මුළු පරිභෝජන වියදම | 4800 |
| රාජ්‍ය පරිභෝජන වියදම | 400 |
| වැයකළ හැකි දළ ජාතික ආදායම | 5400 |
| ශුද්ධ අපනයන | 300 |
| විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම | 800 |

1. රු.බි 500 2. රු.බි 600 3. රු.බි 1100 4. රු.බි 1200 5. රු.බි 5000

35. සරල ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය $S = -600+0.2Y$ ලෙස ඇතැයි සලකන්න. මෙම ආර්ථිකය පිළිබඳ දී ඇති තොරතුරුවලට අනුව **නිවැරදි** වරණය කුමක්ද?
1. ආදායම් වැඩි වන විට ආන්තික ඉතුරුම් නැම්යාව වැඩිවේ.
2. ආදායම වැඩිවන විට ආන්තික පරිභෝජන නැම්යාව ඉහළ යයි.
3. ආදායම වැඩිවෙත්ම සාමාන්‍ය පරිභෝජන නැම්යාව වැඩිවේ.
4. ආදායම වැඩිවෙත්ම සාමාන්‍ය ඉතුරුම් නැම්යාව වැඩි වේ.
5. සෑම ආදායම් මට්ටමකදීම ඉතුරුම් සෘණ අගයක් ගනී.

36. සාර්ව ආර්ථික සමතුලිතය යනු කුමක්ද?
1. ආර්ථිකයක ඉතුරුම් වලවටිනාකම ආයෝජන වල වටිනාකමට සමාන වන තත්වයකි.
2. මිල මට්ටම ස්ථාවරව පවත්වා ගනිමින් වෙළෙඳ හිඟය අවම කර ගැනීම.
3. ආර්ථිකයක සමස්ත නිමැවුම් මට්ටම උච්චාවචන වලින් තොරව පවතින තත්වයක්.
4. ආර්ථිකයක භාණ්ඩ වෙළඳපොළ හා සාධක වෙළෙඳපොළ මිල ගණන් ස්ථාවරව පවතින තත්වයක්.
5. ආර්ථිකයක ප්‍රතිගමනාත්මක නිමැවුම් පරතරයක් දක්නට නොමැති තත්වයක්.

37. රජය ඇතුළත් නොවූ අවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 400 + 0.9y$ වේ. මෙම ආර්ථිකයේ ආයෝජනය රු.මි. 200 න් වැඩි වුවහොත් පරිභෝජන වියදම කොපමණ ප්‍රමාණයකින් වැඩිවේද?
1. රු.මි. 580 2. 600 3. රු.මි. 1800 4. රු.මි. 2000 5. රු.මි. 2200

38. $45^0$ රේඛාවට පහළින් පරිභෝජන ශ්‍රිතය ගමන් කරන විට ඊට අදාළ ආදායම් පරාසය තුළදී කුටුම්බ,
1. නිර් ඉතුරුම් ජනනය කරයි.
2. වැඩිවන ආදායම සම්පූර්ණයෙන්ම ඉතිරි කරයි.
3. වැඩිවන ආදායම සම්පූර්ණයෙන්ම පරිභෝජනය කරයි.
4. තම ආදායමින් කොටසක් ඉතිරි කරයි.
5. වැයකළ හැකි ආදායම ඉක්මවා පරිභෝජනය කරයි.

39. විවෘත ආර්ථිකයක සමතුලිතයට අදාළ පහත සඳහන් දත්ත ඔබට සපයා ඇතැයි සලකන්න.

| **අයිතමය** | **රු.මි** |
|---|---|
| ආර්ථිකයේ මුළු කාන්දුවීම | 2400 |
| ආනයන වල වටිනාකම | 400 |
| ආයෝජනය | 700 |
| රාජ්‍ය වියදම් | 1400 |



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


NWP - EXAM

මෙම ආර්ථිකයේ ශුද්ධ අපනයන වල වටිනාමක කොපමණද?

1. රු.මි. -100 2. රු.මි. 100 3. රු.මි. 200 4. රු.මි. 300 5. රු.මි. -400

40. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රසාරණයක් හට ගැනීමට හේතුවෙන්නේ පහත සඳහන් කවර ක්‍රියාමාර්ගයකදීද?
1. ආණ්ඩුවේ මිලදී ගැනීම් හා බදු අය කිරීම් යන දෙකම රුපියල් බිලියන 100 න් ඉහළ යාම.
2. ආණ්ඩුවේ මිලදී ගැනීම් හා බදු අය කිරීම් යන දෙකම රුපියල් බිලියන 100න් අඩුවේ.
3. රුපියල් බිලියන 100න් බදු වැඩි කිරීම.
4. රුපියල් බිලියන 100 න් ආණ්ඩුවේ මිලදී ගැනීම් අඩු වීම.
5. රුපියල් බිලියන 100න් ශුද්ධ අපයනය පහළ යාම.

41. පහත රූප සටහනේ පෙන්නුම් කරන්නේ ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීමයි.




සමතුලිත ජාතික ආදායම් $Y_1$ ලෙසත්, පූර්ණසේවා නියුක්ති නිමැවුම YF ලෙසත් සලකන්න. LM දුර ප්‍රමාණයන් නිරූපණය වන්නේ,
1. උද්ධමනාත්මක පරතරයයි. 2. ඍණ නිමැවුම් පරතරයයි.
3. ධන නිමැවුම් පරතරයයි. 4. සැබෑ නිමැවුම් හා විභව නිමැවුම අතර පරතරයයි.
5. අවධමනාත්මක පරතරයයි.

42. පහත සඳහන් වත්කම් අතුරින් වඩාත් ද්‍රවශීල වත්කම වන්නේ,
1. ස්ථාවර වත්කම් 2. භාණ්ඩාගාර බැඳුම්කර 3. ඉල්ලුම් තැන්පතුය
4. භාණ්ඩාගාර බිල්පත්‍ය 5. ඉතුරුම් තැන්පතුය

43. මුදල් වෙනත් වත්කම්වලින් වෙන්කර හඳුනාගත හැකි ප්‍රධානතම ලක්ෂණය වන්නේ,
1. ගනුදෙනු කිරීමේ හැකියාවයි. 2. පූර්ණ ද්‍රවශීලතාවයයි.
3. වටිනාකමේ සන්නිධියක් වීමයි. 4. කල්පසුවූ ගෙවුම් මාධ්‍යයක් වීමයි.
5. පොදු පිළිගැනීමයි.

44. පහත සඳහන් දෑ අතුරින් වාණිජ බැංකුවක වගකීමක් ලෙස සැලකෙනුයේ කවරක්ද?
1. කාලීන හා ඉතුරුම් තැන්පතුය. 2. වට්ටම් කල බිල්පත්‍ය.
3. අතැන් මුදල්ය. 4. ණය සහ ආයෝජනය.
5. මහ බැංකුවේ ඇති තැන්පතුය.

45. මහබැංකුව විසින් නියමකළ සංචිත අනුපාතය 40% ක් නම් ණයගුණකයේ අගය කොපමණද?
1. K = 20 යි 2. K = 10 යි 3. K = 5 යි
4. K = 4 යි 5. K = 2.5 යි

46. නිරුද්ධමනය යනුවෙන් අදහස් වන්නේ,
1. රටක සාමාන්‍ය මිල මට්ටමේ පහළ යාමයි.
2. රටක සාමාන්‍ය මිල මට්ටම අඛණ්ඩව ඉහළ යාමයි.
3. උද්ධාමන අනුපාතයේ ප්‍රමාණය වැඩිවීමයි.
4. උද්ධමන වේගයේ පහළ යාමකි.
5. රටක සාමාන්‍ය මිල මට්ටම අවධමනය වීමකි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

47. කල්පිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතියේ එක් වාණිජ බැංකුවක රු.10000ක මුදලක් තැන්පත් කලේයැයි සිතන්න. සංචිත අනුපාතය 20% ක්නම් ණය මැවීම සම්පූර්ණ කළවිට පද්ධතියේ මුළු තැන්පතු කොපමණවේද?
   1. රු. 20,000 යි
   2. රු. 25,000 යි
   3. රු. 100,000 යි
   4. රු. 40,000 යි
   5. රු. 50,000 යි

48. ශුද්ධ පොදු භාණ්ඩයක් යනු,
   1. පාරිභෝජනයේ තරඟකාරිත්වයක් නැති පාරිභෝජනය වැලැක්විය නොහැකි භාණ්ඩයකි.
   2. පරිභෝජනයේ තරඟකාරිත්වයක් ඇති පරිභෝජනය වැළැක්විය හැකි භාණ්ඩයකි.
   3. වෙළඳපොළ මගින් කාර්යක්ෂමතාව සහිත භාණ්ඩයකි.
   4. පාරිභෝජණයේ ධන බාහිරතා සහිත භාණ්ඩයකි.
   5. ශුන්‍ය මිලකදී අසීමිත සැපයුමක් ඇති භාණ්ඩයකි.

49. සමාන ආදායම් ලබන පුද්ගයින් සමාන බද්දකට යටත්කළ විට ඉටුවන්නේ
   1. සරල බවයි.
   2. මධ්‍යස්ථ බවයි.
   3. සිරස් සමානාත්මභාවයයි.
   4. තිරස් සමානාත්මභාවයයි.
   5. කාර්යක්ෂමතාවයයි.

50. වර්තමාන ශ්‍රී ලංකාවේ වර්තන වියදමේ විශාලම සංරචකය වනුයේ,
   1. කොරෝනා ගෙවීම්ය.
   2. පොහොර සහණාධාරයක් ගෙවීමය.
   3. විශ්‍රාම වැටුප් ගෙවීමය.
   4. පොලී ගෙවීම්ය.
   5. වැටුප් ගෙවීම්ය.

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 21 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 13 - 2020

විභාග අංකය ............................ **ආර්ථික විද්‍යාව II** කාලය පැය තුනයි

❖ **''අ '' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද ''ආ'' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## අ උප කොටස

01). i. ''ආර්ථික සම්පත්'' යන්න නිර්වචනය කර ආර්ථික විද්‍යාඥයින් ඒවා වර්ග කර දක්වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 4)

ii. කිසියම් භාණ්ඩයක් පරිභෝජනය සඳහා මිලක් නොගෙවූ පමණින් ආර්ථික නොවන භාණ්ඩයක් වේද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. නිදහස් වෙළඳපොල ආර්ථිකයක් මධ්‍යගත සැලසුම් ආර්ථිකයකින් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 4)

iv. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටි ඕනෑම ලක්ෂයකින් කුමක් අදහස් වන්නේද? (ලකුණු 2)

v. නිෂ්පාදන හැකියා වක්‍ර සම්බන්ධයෙන් පහත සඳහන් අවස්ථා ප්‍රස්තාර සටහන්ද යොදාගෙන පැහැදිලි කරන්න.

අ). නිෂ්පාදන හැකියා මායිම විතැන්වීම

ආ) හැකියා මායිමට වම් පස ලක්ෂයක කටයුතු කිරීම.

ඇ). හැකියා මායිමට පිටත ලක්ෂ්‍යක පරිභෝජනය කළහැකිවීම. (ලකුණු 6)

02). i. මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර සම්බන්ධතාව සුදුසු රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. වෙළඳපොළ සැපයුම් වක්‍රයක් නිර්මාණය කිරීමේදී ස්ථාවරව පවතී යයි සලකනු ලබන සාධක කවරේද? (ලකුණු 4)

iii. තරඟකාරී වෙළඳපොලක අළෙවි වන භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයම් සමීකරණ පහත පරිදි වේ යයි සිතන්න.

$$Qd = 100 - 4P$$
$$Qs = -30 + 6P$$

(අ) මෙම සමීකරණ යොදාගෙන ඉල්ලුම් සැපයුම් වක්‍ර ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 2)

(ආ) සමතුලිත මිල හා ප්‍රමාණය ලකුණු කරන්න (ලකුණු 1)

(ඇ) සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)

iv. පුද්ගලයෙකුගේ ආදායම රු.1000ක් වන විට ඉල්ලුම් ප්‍රමාණය 500 ක්ද ආදායම රු.1100 ක් වන විට ඉල්ලුම් ප්‍රමාණය 100 කින් වැඩි විය. මෙම තොරතුරු මගින් ආදායම් ඉල්ලුම් නම්‍යතාව ගණනය කර එම භාණ්ඩය ඔහුට කුමන භාණ්ඩ වර්ගයක්ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 3)

v. පහත දැක්වෙන එක් එක් අවස්ථා ප්‍රස්තා සටහන් මගින් දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය කවර දිශාවන්ට වෙනස් වන්නේ දැයි පැහැදිලි කරන්න.

(අ) ඉල්ලුම වැඩිවන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් සැපයුම අඩුවීම

(ආ) ඉල්ලුම හා සැපයුම සමාන ප්‍රතිශතයකින් ඉහළයාම. (ලකුණු 4)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

03). i. නිදහස් වෙළඳපොළ ක්‍රියාවලියට රජය මැදිහත්වන ප්‍රධාන ආකාර 02ක් ලියා දක්වන්න (ලකුණු 2)

ii. භාණ්ඩමත පනවනු ලබන බදු අනුපාතිකවල ස්වරූප දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. අනම්‍ය ඉල්ලුම් අවස්ථාවක් සම්බන්ධයෙන් ඒකක බද්දක් පැනවූ අවස්ථාවක් රූප සටහනක් මගින් දක්වා බදුබර බෙදීයන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. එක්තරා වෙළඳපොළක මිල, ඉල්ලුම්, සැපයුම් දත්ත ඇතුළත් සංඛ්‍යා ලේඛනයක් පහත දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය | බද්දෙන් පසු සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|
| 10 | 500 | 100 | |
| 20 | 400 | 200 | |
| 30 | 300 | 300 | |
| 40 | 200 | 400 | |
| 50 | 100 | 500 | |

(අ) භාණ්ඩයට රුපියල් 20ක් වන සේ ඒකක බද්දක් පැනවීම පදනම්කරගෙන බද්දෙන් පසු සැපයුම් ප්‍රමාණය ලියා දක්වන්න. (ලකුණු 1)

(ආ) ඉහත තොරතුරු වලට අදාල ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇඳ සමතුලිත මිල හා ප්‍රමාණය ලියා දක්වන්න. (ලකුණු 2)

(ඇ) බද්දෙන් පසු සැපයුම් වක්‍රය ඇඳ නව සමතුලිත මිල හා ප්‍රමාණය ලියා දක්වන්න. (ලකුණු 3)

(ආ) බද්ද නිසා පාරිභෝගික අතිරික්තයේ අඩුවීමත්, නිෂ්පාදන අතික්තයේ අඩුවීමත් ගණනය කොට දක්වන්න. (ලකුණු 4)

04). i. උපරිම මිල ප්‍රතිපත්තියක් තුළින් බිහිවිය හැකි ආර්ථික අකාර්යක්ෂමතාවට හේතුවන කරුණු 02ක් දක්වන්න. (ලකුණු 2)

ii. උපරිම මිල පැනවීම නිසා හිඟ භාණ්ඩ සලාක කිරීමට සිදුවේ. මේ සඳහා භාවිතා කරන මිල නොවන මාධ්‍යයන් 03ක් දක්වන්න. (ලකුණු 3)

iii. Qd = 60 – 2P QS = -10+3Pලෙස දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක ඉල්ලුම් වක්‍රයේ හා සැපයුම් වක්‍රයේ සමීකරණ දෙකකි.

(අ). මෙම භාණ්ඩයේ එක් ඒකකයක් මත රු. 5/= ක සහනාධාරයක් සපයන්නේ නම් සහනාධාරයෙන් පසු නිෂ්පාදකයාට ලැබෙන මිලත් පාරිභෝගිකයා ගෙවන මිලත් සමීකරණ භාවිතයෙන් සෙයන්න. (ලකුණු 2)

(ආ). සමීකරණ වලට අදාළ වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අදින්න. (ලකුණු 2)

(ඉ). වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ලියා දක්වන්න. (ලකුණු 2)

(ඊ). සහනාධාරයෙන් පසු සැපයුම් වක්‍රය ඉහත ප්‍රස්ථාරයේම ඇඳ නව සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 4)

(උ) සහනාධාරයේ ප්‍රමාණය ලකුණු කොට දක්වන්න. (ලකුණු 1)

(ඌ) සහනාධාරයෙන් නිෂ්පාදකයා ලබන වාසිය හා පාරිභෝගිකයා ලබන වාසිය ගණනය කොට දක්වන්න. (ලකුණු 4)

05). i. වෙළඳපොළ ව්‍යුහයන්ගේ ස්වරූප මොනවාද? (ලකුණු 4)

ii. පූර්ණතරඟකාරී වෙළඳපොළක විශේෂ ලක්ෂණ 04ක් ලියා දක්වන්න. (ලකුණු 4)

iii. කෙටිකාලයේදී ආයතනයක් විවිධවූ ලාභ ලබමින් නිෂ්පාදනයේ නිරත වේ. එම අවස්ථා 03 නම් කරන්න. (ලකුණු 3)

iv. වෙළඳපොළ ආර්ථිකයක ලාභය (ආර්ථික ලාභය) මගින් ඉටුකරන කාර්යයන් මොනවාද? (ලකුණු 5)

v. ආයතනයක් කෙටිකාලයේදී ආර්ථික ලාභ සහිතව නිෂ්පාදනයේ යෙදෙන අවස්ථාවක් කල්පිත සංඛ්‍යා යොදාගෙන රූපසටහන් ඇසුරෙන් ගණනය කොට දක්වන්න. (ලකුණු 4)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

AWP-EXAM

## <u>ආ උප කොටස</u>

06). i. දළ දේශීය නිෂ්පාදනය හා දළ ජාතික ආදායම යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. රටක ජාතික ආදායම ගණනය කිරීමේදී බැහැර කෙරෙන නමුත් පෞද්ගලික ආදායම ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සංරචකයන් කවරේද? (ලකුණු 2)

iii. දළ මෙහෙයුම් අතිරික්තය හා මිශ්‍ර ආදායම් යන ප්‍රාථමික ආදායම් සංරචක අතර පවත්නා වෙනස පැහැදිලි කරන්න (ලකුණු 4)

iv. අ) සරල ආර්ථිකයක ස්වයීන පරිභෝජනය රු. බිලියන 400ක්ද, ආන්තික පරිභෝජන නැමියාව (MPC) 0.8 ක්ද වේයැයි සලකන්න. වැයකළ හැකි ආදායම රු.බිලියන 5000ක් වේනම් සාමාන්‍ය ඉතුරුම් නැමියාව හා සාමාන්‍ය පරිභෝජන නැමියාව ගණනය කරන්න. (ලකුණු 4)

ආ) ඉහත ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම රු.බි. 5000ක් වේනම් ආයෝජන වියදම් වල අගය කොපමණද? (ලකුණු 2)

ඉ) මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම සමාහාර ආදායම් වියදම් රූපසටහනකින් ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

ඊ) ආයෝජන ගුණකයේ අගය කොපමණද? (ලකුණු 2)

07). i. පහත සඳහන් දෑ නිෂ්පාදන ඉමට ඇතුළත්වේද? පැහැදිලි කරන්න

(අ) මව විසින් තම දරුවාගේ පාසල් නිළ ඇඳුම මසා දීම

(ආ) නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම්

(ඉ) භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගෙවනු ලබන පොලිය

(ඊ) රජය විසින් සපයන නිදහස් අධ්‍යාපනය (කරුණකට ල. 1 බැගින් ල. 4)

ii. කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත දී ඇතැයි සලකන්න. (සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | |
|---|---|
| දළ දේශීය වියදම | 430 |
| මුළු පරිභෝජන වියදම | 360 |
| අපනයන ඉපයීම | 250 |
| ආනයන වියදම | 280 |
| විදේශීය ඉතුරුම් | 200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 50 |
| නිෂ්පාදනය මත පනවන ලද සහනාධාර අඩුකළ වෙනත් බදු | 20 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදනය

(ආ) දේශීය ඉතුරුම්

(ඉ) වැයකළ හැකි දළ ජාතික ආදායම

(ඊ) මුළු සම්පත් සංයුතිය (ලකුණු 2 බැගින් ල. 8)

iii. ස්වායක්ත ඉතුරුම් $(-a)$ හා ආන්තික ඉතුරුම් නැමියාව (MPS) යන සංකල්ප හඳුන්වන්න. (ලකුණු 4)

iv. බදු අයකිරීමක් නැති එක්තරා ආර්ථිකයක ආදායම රු1000 දී පරිභෝජන වියදම (C) රු 800 ක් වන අතර ආදායම 1500 දී පරිභෝජන වියදම රු 1175ක් වේ.

අ). මෙම දත්ත ඇසුරෙන් පරිභෝජන ශ්‍රිතයට අදාල සමීකරණය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 2)

ආ). රජය මෙම ආර්ථිකයට ස්ථාවර බදු ක්‍රමයක් හඳුන්වා දී සෑම ආදායම් වට්ටමකදීම රු 20ක් බදු වශයෙන් අය කරයි නම් බදු අයකිරීමෙන් පසු පරිභෝජන ශ්‍රිතයට අදාල සමීකරණය ගොඩනගන්න. (ලකුණු 2)

NMP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08). i. මුදල් යනුවෙන් කුමක් අදහස්වේද? (ලකුණු 2)
ii. හොඳ මුදලක තිබිය යුතු ගුණාංග 4ක් නම් කරන්න. (ලකුණු 4)
iii. මුදලේ කාර්යයන් ලෙස විනිමය මාධ්‍යයන් වීම සහ වටිනාකමේ සන්නිධියක් වීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)
iv. ආසන්න මුදල් සහ ආදේශ මුදල් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)
v. මූල්‍ය පදනම යනුවෙන් කුමක් අදහස්වේද? පදනම් මුදල් තීරණය කිරීම සඳහා බලපාන සාධක මොනවාද? (ලකුණු 6)

09). i. උද්ධමනය අවධමනය හා නිරුද්ධමනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 3)
ii. ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීම සඳහා භාවිතා කරන මිනුම් මොනවාද? (ලකුණු 3)
iii. මහ බැංකුවේ වත්මන් අරමුණු දෙක නම් කරන්න. (ලකුණු 2)
iv. මහ බැංකුවේ ණය පාලන උපකරණ මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 4)
v කල්පිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතියක් ඇතැයිද එයින් එක් වාණිජ බැංකුවක පුද්ගයකු රුපියල් 20000 මුදලක් තැන්පත් කලබව සිතන්න. මහබැංකුවේ සංචිත අනුපාතය 25% ක් නම්

(අ) මෙම බැංකුවේ අධිසංචිත ප්‍රමාණය කොපමණද?
(ආ) ණය ගුණකයේ අගය කොපමණද?
(ඇ) අධිසංචිත ණයට දුන්පසු එම ණය එම බැංකුවේම තැන්පත් කළේ නම් එම බැංකුවේ ශේෂ පත්‍රය සකස් කරන්න.
(ඈ) ණය මැවීම සම්පූර්ණ කලවිට බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය සකස් කරන්න. (ලකුණු 8)

10). i. වෙළඳපොළ ආර්ථිකයක සම්පත් බෙදීයාම ආකාර්යක්ෂම වේ. ඒ සඳහා බලපෑ හේතු මොනවාද? (ලකුණු 4)
ii. බාහිරතා ප්‍රභේද 4ක් නම් කරන්න. (ලකුණු 4)
iii. වෙළඳපොල ආර්ථිකයක රජයේ කර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)
iv. බාහිරතා අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග නම් කරන්න. (ලකුණු 4)
v. හොඳ බදුක්‍රමයක මූලික ලක්ෂණ මොනවාද? (ලකුණු 4)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

# 2020 - පළමු වාර පරීක්ෂණය
# 13 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව

**<u>පිළිතුරු පත්‍රය</u>**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | 4 | 11) | 4 | 21) | 3 | 31) | 2 | 41) | 5 |
| 2) | 2 | 12) | 5 | 22) | 3 | 32) | 3 | 42) | 3 |
| 3) | 1 | 13) | 4 | 23) | 5 | 33) | 1 | 43) | 2 |
| 4) | 2 | 14) | 2 | 24) | 4 | 34) | 2 | 44) | 1 |
| 5) | 4 | 15) | 2 | 25) | 5 | 35) | 4 | 45) | 5 |
| 6) | 5 | 16) | 5 | 26) | 2 | 36) | 3 | 46) | 4 |
| 7) | 1 | 17) | 3 | 27) | 3 | 37) | 3 | 47) | 5 |
| 8) | 2 | 18) | 2 | 28) | 5 | 38) | 4 | 48) | 1 |
| 9) | 3 | 19) | 1 | 29) | 3 | 39) | 1 | 49) | 4 |
| 10) | 2 | 20) | 5 | 30) | 5 | 40) | 1 | 50) | 4 |

## II කොටස
## <u>අ උප කොටස</u>

01). **i.** **''අර්ථික සම්පත්'' යන්න නර්වචනය කර ආර්ථික විද්‍යාඥයින් ඒවා වර්ග කර දක්වන ආකාරය පෙන්වා දෙන්න.** (ලකුණු 4)
**ii.** **කිසියම් භාණ්ඩයක් පරිභෝජනය සඳහා මිලක් නොගෙවූ පමණින් ආර්ථික නොවන භාණ්ඩයක් වේද? පැහැදිලි කරන්න.** (ලකුණු 4)
**iii.** **නිදහස් වෙළඳපොල ආර්ථිකයක් මධ්‍යගත සැලසුම් ආර්ථිකයකින් වෙනස් වන්නේ කෙසේද?** (ලකුණු 4)
**iv.** **නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටි ඕනෑම ලක්ෂයකින් කුමක් අදහස් වන්නේද?** (ලකුණු 2)
**v.** **නිෂ්පාදන හැකියා වක්‍ර සම්බන්ධයෙන් පහත සඳහන් අවස්ථා ප්‍රස්තාර සටහන්ද යොදාගෙන පැහැදිලි කරන්න.**
**අ). නිෂ්පාදන හැකියා මායිම විතැන්වීම**
**ආ) හැකියා මායිමට වම් සප ලක්ෂයක කටයුතු කිරීම.**
**ඇ). හැකියා මායිමට පිටත ලක්ෂ්‍යක පරිභෝජනය කළහැකිවීම.** (ලකුණු 6)

01). i. - නිෂ්පාදන සම්පත් අතුරින් සීමිත සැපයුමක් ඇති හිග සම්පත් ආර්ථික සම්පත් ලෙස හැඳින්වේ. මේවා හිඟ බැවින් වෙළඳපල මිලක් පවතී. (ලකුණු 2)

- ආර්ථික සම්පත් ප්‍රභේද 4කට වර්ග කළ හැක.
  1. භූමිය හෙවත් ස්වාභාවික සම්පත්
  2. ප්‍රාග්ධනය
  3. ශ්‍රමය
  4. ව්‍යවසායකත්වය

  මේවා තවත් ආකාරයකට වර්ග කළහැකිය.
  - දේපොළ සම්පත්
    - ස්වාභාවික සම්පත්, ප්‍රාග්ධනය
  - මානව සම්පත්
    - ශ්‍රමය, ව්‍යවසායකත්වය (ඕනෑම වර්ග කිරීමකට ල. 2යි.)

ii. - හිඟකමක් හිමිකමක් නොමැති ශුන්‍ය මිලදී අසීමිත සැපයුමක් ඇති භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ. මේවා සෑම පුද්ගලයෙකුගේ වුවමනා සපුරාලීමට යොදා ගැනේ. එවැනි භාණ්ඩයක් කිසිදු කැපකිරීමකින් තොරව ලබාගත හැකිය. එම නිසා මේවායේ ආවස්ථික පිරිවැය නොමැත.
- ආර්ථික නොවන භාණ්ඩ හඳුනා ගත හැක්කේ මිලක් ගෙවනවාද නැද්ද යන්න මත නොවේ. (ලකුණු 2)
- බොහෝ අවස්ථාවල හිඟ සම්පත් භාවිතා කර නිෂ්පාදනය කරනු ලැබ ඇති භාණ්ඩද සමාජ සුබසාධනය හෝ ප්‍රචාරණය සඳහා හෝ මිලක් අය නොකර මහජනයා වෙත ලබා දෙයි. එසේ එවැනි භාණ්ඩ නොමිලේ ලබා දුන්නද ඒවා නිෂ්පාදනය සඳහා හිඟ සම්පත් යොදා ගනිමින් පිරිවැයක්ද දරා ඇත.
- මෙසේ ආර්ථික භාණ්ඩ නොමිලේ ලබා දුන්නද ඒවා ආර්ථික නොවන භාණ්ඩ වන්නේ නැත. (ලකුණු 2)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


iii.

| නිදහස් වෙළඳපොළ ආර්ථිකය | මධ්‍යගත සැලසුම් ආර්ථිකය |
|---|---|
| - සම්පත්වල පෞද්ගලික අයිතිය. | -සම්පත්වල රාජ්‍ය හිමිකාරිත්වය. |
| - පෞද්ගලික ව්‍යවසාය. | -රාජ්‍ය ව්‍යවසාය. |
| - තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකේන්ද්‍රණය වීම. | -තීරණ ගැනීමේ ක්‍රියාලවලිය කේන්ද්‍රගතවීම. |
| - මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම. | -මධ්‍යගත සැලසුම් යන්ත්‍රණය. |
| ( වෙළඳපලට සහභාගිවන සියල්ලෝම ස්වාර්ථය ඕ මත කටයුතු කිරීම. | -සම්පත් භාවිතය නිෂ්පාදන තීරණගැනීම. සමාජ සුභසාධනය පදනම් කර ගැනීම. |
| න දැඩි තරඟකාරිත්වයක් පවතී. | -තරඟකාරිත්වයක් නොපැවතීම. |
| ෑ ආණ්ඩුවේ පාර්යභාරය සීමිතවීම. | -නිෂ්පාදන, පරිභෝජන හා බෙදාහැරීම වැනි සෑම අංශයකම රජයේ මැදිහත්වීම. |
| ඖ සම්පත් උපයෝජනය කාර්යක්ෂමවීම. | -සම්පත් නාස්තියක් හට ගැනීම. |

සැසඳෙන කරුණු යුගලයකට ල. 1 බැගින් මුළු ලකුණු 4යි.)


iv. - නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටි ඕනෑම ලක්ෂයකින් අදහස් වන්නේ අර්ථිකයක් සතු සියලු සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ විට ලබාගත ඉහළම භාණ්ඩ සංයෝජනයන්ය. (ල. 2)

v. (අ) නිෂ්පාදන හැකියා මායිම විතැන්වීම යනු සම්පත් වැඩි වීමකින් හෝ ඒවායේ ඵලදායීතාව වෙනස්වීමකින් හැකියා මායිම්වක්‍රය වමට හෝ දකුණට ගමන් කිරීමයි. සම්පත් වැඩිවීම හෝ ඵලදායීතාව වැඩිවීමකදී මායිම් වක්‍රය දකුණටත් සම්පත් අඩුවීම හො ඵලදායීතාව අඩුවීමකදී වක්‍රය වමටත් ගමන් කරයි. (ල. 1)





(ල. 1)

(ආ) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මගින් සම්පත් පූර්ණ හා කාර්යක්ෂම උපයෝජනය තුළින් ලබාගත හැකි උපරිම නිමැවුම් සංයෝග දැක්වෙන අතර වම්පස ලක්ෂයක කටයුතු කිරීමෙන් අදහස් වන්නේ පවතින සම්පත් පූර්ණ හා උපරිම කර්යක්ෂමතාවයෙන් භාවිතා නොකරන තත්වයකි. එනම් ඌන උපයෝජනයක් නැතිනම් සේවා වියුක්ත තත්වයකි. (ල. 1)




(ල. 1)

(ඇ) නිෂ්පදාන හැකියා මායිම මගින් පවතින සියලු සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වී ඇති විටක හැකියා වක්‍රයට පිටත ලක්ෂයක නිෂ්පාදනය කළ නොහැක. එහිදී සම්පත් හිඟකම පිළිඹිමු වේ. එහෙත් හැකියා මායිමට පිටත ලක්ෂයක පරිභෝජනය අත්කර ගත හැක. භාණ්ඩ විදේශ රටකින් ආනයනය කිරීම තුළින් රට තුළ නිෂ්පාදනය නොකලත් පරිභෝජනය කළ හැක. (ල. 1)




(ල. 1)

**02). i. මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර සම්බන්ධතාව සුදුසු රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**ii. වෙළඳපොළ සැපයුම් වක්‍රයක් නිර්මාණය කිරීමේදී ස්ථාවරව පවතී යයි සලකනු ලබන සාධක කවරේද? (ලකුණු 4)**

**iii. තරඟකාරී වෙළඳපොලක අළෙවි වන භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයම් සමීකරණ පහත පරිදි වේ යයි සිතන්න.**

**$Qd = 100 - 4P \quad Qs = -30 + 6P$**

**(අ) මෙම සමීකරණ යොදාගෙන ඉල්ලුම් සැපයුම් වක්‍ර ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 2)**

**(ආ) සමතුලිත මිල හා ප්‍රමාණය ලකුණු කරන්න (ලකුණු 1)**

**(ඇ) සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)**


**iv. පුද්ගලයෙකුගේ ආදායම රු.1000ක් වන විට ඉල්ලුම් ප්‍රමාණය 500 ක්ද ආදායම රු.1100 ක් වන විට ඉල්ලුම් ප්‍රමාණය 100 කින් වැඩි විය. මෙම තොරතුරු මගින් ආදායම් ඉල්ලුම් නම්‍යතාව ගණනය කර එම භාණ්ඩය ඔහුට කුමන භාණ්ඩ වර්ගයක්ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 3)**

**v. පහත දැක්වෙන එක් එක් අවස්ථා ප්‍රස්තා සටහන් මගින් දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය කවර දිශාවන්ට වෙනස් වන්නේ දැයි පැහැදිලි කරන්න.**

**(අ) ඉල්ලුම වැඩිවන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් සැපයුම අඩුවීම**

**(ආ) ඉල්ලුම හා සැපයුම සමාන ප්‍රතිශතයකින් ඉහළයාම. (ලකුණු 4)**

02). i. ආර්ථික න්‍යායන්ට අනුව මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී. මිල වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවන අතර මිල අඩුවන විට ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ. එය පහත පරිදි ඉල්ලුම් වක්‍රයකින් දැක්විය හැක. මෙහි බෑවුම සෘණ අගයක් ගනී. ඒ අනුව ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට බෑවුම් වේ.




(ලකුණු 2)




මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

ii). - යෙදවුම් මිල (C)
- තාක්ෂණය (T)
- සම්බන්ධිත භාණ්ඩ මිල ගණන් (Pn)
- නිෂ්පාදකයාගේ අපේක්ෂාව (Ex)
- රජයේ ප්‍රතිපත්ති (G) (ල. 4)

iii). (අ) සමතුලිත මිල හා ප්‍රමාණය

| | |
|---|---|
| Qd = Qs | Qd = 100-4P |
| 100 - 4P = -30 + 6P | = 1000- 4x13 |
| 100 + 30 = 6P + 4P | = 100 -52 |
| 130 = 10P | Qd = 48 |
| P = 13 | |

(අ).
(ආ)




(වක්‍ර දෙක නිවැරදිව ඇඳීමට ල. 2යි. සමතුලිත මිල හා ප්‍රමාණය ලකුණු කිරීමට ල. 1යි.)

(ඇ) මිල ඉල්ලුම් නම්‍යතාව

$$Ed = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Qd}$$
$$= -4 \times \frac{13}{48}$$
$$= -1.08$$
(ලකුණු 1)

සැපයුම් නම්‍යතාව

$$\eta = \frac{\Delta QS}{\Delta P} \times \frac{P}{Qs}$$
$$= 6 \times \frac{13}{48}$$
$$= 1.62$$
(ලකුණු 1)

iv). -


| Y | Qd |
|---|---|
| 1000 | 500 |
| 1100 | 600 |

- ආදායම් ඉල්ලුම් නම්‍යතාව $= \frac{\Delta Qd}{\Delta y} \times \frac{y}{Qd}$

$$\frac{100}{100} \times \frac{1000}{500}$$
$$2$$

ආදායම් ඉලලුම් නම්‍යතාව 1ට වැඩි නම් සුඛෝබබෝගී භාණ්ඩ වේ. මෙම භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව 2 ක් නිසා එය සුඛෝපභෝගී භාණ්ඩයකි.
(ගණනය කිරීමට ල. 2යි. හේතු සහිතව භාණ්ඩ වර්ගය නම් කිරීමට (ල. 2යි.)
(හේතුව නොමැතිව භාණ්ඩ වර්ගය නම් කිරීමට ල. 1)


v). (අ)




ඉල්ලුම් වැඩිවන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් සැපයුම අඩුවන විට සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය වෙනස් වේ. අවිනිශ්චිත වේ. (ල. 1 යි.)

(ප්‍රස්තාරයට ල. 1 යි)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.




ඉල්ලුම හා සැපයුම සමාන ප්‍රතිශතයකින් ඉහළ යන විට සමතුලිත ප්‍රමාණය වැඩිවන අතර සමතුලිතමිල වෙනස් නොවේ. (ල. 1 යි)

(ප්‍රස්තාරයට ල. 1 යි)

**03). i.** **නිදහස් වෙළඳපොළ ක්‍රියාවලියට රජය මැදිහත්වන ප්‍රධාන ආකාර 02ක් ලියා දක්වන්න** (ලකුණු 2)

**ii.** **භාණ්ඩමත පනවනු ලබන බදු අනුපාතිකවල ස්වරූප දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.** (ලකුණු 4)

**iii.** **අනම්‍ය ඉල්ලුම් අවස්ථාවක් සම්බන්ධයෙන් නිෂ්පාදකයන් මත ඒකක බද්දක් පැනවූ අවස්ථාවක් රූප සටහනක් මගින් දක්වා බදුබර බෙදීයන ආකාරය පැහැදිලි කරන්න.** (ලකුණු 4)

**iv.** **එක්තරා වෙළඳපොළක මිල, ඉල්ලුම්, සැපයුම් දත්ත ඇතුළත් සංඛ්‍යා ලේඛනයක් පහත දැක්වේ.**

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය | බද්දෙන් පසු සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|
| 10 | 500 | 100 | |
| 20 | 400 | 200 | |
| 30 | 300 | 300 | |
| 40 | 200 | 400 | |
| 50 | 100 | 500 | |

**(අ) භාණ්ඩයට රුපියල් 20ක් වන සේ ඒකක බද්දක් පැනවීම පදනම්කරගෙන බද්දෙන් පසු සැපයුම් ප්‍රමාණය ලියා දක්වන්න. (ලකුණු 1)**

**(ආ) ඉහත තොරතුරු වලට අදාල ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇඳ සමතුලිත මිල හා ප්‍රමාණය ලියා දක්වන්න.** (ලකුණු 2)

**(ඇ) බද්දෙන් පසු සැපයුම් වක්‍රය ඇඳ නව සමතුලිත මිල හා ප්‍රමාණය ලියා දක්වන්න.** (ලකුණු 3)

**(ආ) බද්ද නිසා පාරිභෝගික අතිරික්තයේ අඩුවීමත්, නිෂ්පාදන අතික්තයේ අඩුවීමත් ගණනය කොට දක්වන්න. (ලකුණු 4)**


03). i). බදු පැනවීම, සහනාධාර ලබාදීමට, මිල පාලනය, මිල ස්ථායිකරණයට (කරුණු 02කට ලකුණු 2)

ii) 1. ප්‍රතිශත බද්ද 2. ඒකක බද්ද

- නිෂ්පාදන හෝ පරිභෝජනය හෝ කරන භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අයකර ගැනීමට ප්‍රතිශතක බද්දක් පැනවීම වශයෙන් හඳුන්වයි.
- නිෂ්පාදන හෝ පරිභෝජනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් මත කිසියම් නිශ්චිත රුපියල් ප්‍රමාණයක් බදුවශයෙන් අයකර ගැනීම ඒකක බද්ද යන්නෙන් අදහස් වේ. මෙය නිශ්චිත බද්දකි.

(ස්වරූප 02 දැකවීමට ලකුණු 02යි. විස්තරයට ලකුණු 2)

iii).




(නිවරදි රූප සටහනට ලකුණු 2)

- $P_1$-$P_2$ දුරින් ඒකක බද්දේ ප්‍රමාණය දැක්වේ.
- පාරිභෝගිකයා දරන බදුබර A කොටසින් දැක්වේ.
- නිෂ්පාදකයා දරන බදුබර B කොටසින් දැක්වේ.
- වැඩි බදුබර පාරිභෝගිකයා දරන අතර අඩු බදුබර නිෂ්පදකයා දරයි.

(පැහැදිලි කිරීමට ලකුණු 2)


iv). (අ)

| **මිල** | **බද්දෙන් පසු සැපයුම් ප්‍රමාණය** |
|---|---|
| 10 | -100 |
| 20 | 0 |
| 30 | 100 |
| 40 | 200 |
| 50 | 300 |

(ප්‍රමාණය දැක්වීමට ලකුණු 1)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ආ) 


සමතුලිත මිල 30 ප්‍රමාණය 300
(නිවැරදි ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇඳීමට ලකුණු 01 යි. සමතුලිතය දැක්වීමට ලකුණු 01යි.)

(ඇ) බද්දෙන් පසු වක්‍රය ඇඳීමට ලකුණු 01යි.
නව සමතුලිත මිල ප්‍රමාණය දැක්වීමට ලකුණු 02යි.

(ඈ) බද්ද නිසා A+F ප්‍රමාණය පාරිභෝගිකයාට අඩුවී ඇත.

E = (40-30) 10x200 = රු. 2000

A = $\frac{1}{2}$ (10x100) = රු. 500

A+E = 2500 (ලකුණු 2)

බද්ධ නිසා නිෂ්පාදන අතිරික්තයේ අඩු වීම B+D වේ.

B = $\frac{1}{2}$ (30-20) x100 = රුපියල්. 500

D = (30-20) x 100 = රුපියල්. 2000

B+D = රුපියල්. 2500 (ලකුණු 2)

**04). i. උපරිම මිල ප්‍රතිපත්තියක් තුළින් බිහිවිය හැකි ආර්ථික අකාර්යක්ෂමතාවට හේතුවන කරුණු 02ක් දක්වන්න. (ලකුණු 2)**

**ii. උපරිම මිල පැනවීම නිසා හිඟ භාණ්ඩ සලාක කිරීමට සිදුවේ. මේ සඳහා භාවිතා කරන මිල නොවන මාධ්‍යයන් 03ක් දක්වන්න. (ලකුණු 3)**

**iii. Qd = 60 – 2P QS = -10+3Pලෙස දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක ඉල්ලුම් වක්‍රයේ හා සැපයුම් වක්‍රයේ සමීකරණ දෙකකි.**

**(අ). මෙම භාණ්ඩයේ එක් ඒකකයක් මත රු. 5/= ක සහනාධාරයක් සපයන්නේ නම් සහනාධාරයෙන් පසු නිෂ්පාදනයට ලැබෙන මිලත් පාරිභෝගික ගෙවන මිලත් සමීකරණ භාවිතයෙන් සොයන්න. (ලකුණු 2)**

**(ආ). සමීකරණ වලට අදාළ වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අඳින්න. (ලකුණු 2)**

**(ඉ). වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ලියා දක්වන්න. (ලකුණු 2)**

**(ඊ). සහනාධාරයෙන් පසු සැපයුම් වක්‍රය ඉහත ප්‍රස්ථාරයේම ඇඳ නව සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 4)**

**(උ) සහනාධාරයේ ප්‍රමාණය ලකුණු කොට දක්වන්න. (ලකුණු 1)**

**(ඌ) සහනාධාරයෙන් නිෂ්පාදකයා ලබන වාසිය හා පාරිභෝගිකයා ලබන වාසිය ගණනය කොට දක්වන්න. (ලකුණු 4)**

04). i).
- වෙළඳපොළ තුළ භාණ්ඩ හිඟයක් ඇති වීම.
- සැපයුම සීමා කිරීම නිසා නිෂ්පාදන අතිරික්තය අඩුවීම.
- භාණ්ඩ හිඟය නිසා ගැණුම්කරුවන්ට එම භාණ්ඩය මිලදී ගැනීමට අතිරේක පිරිවැයක් දැරීමට සිදුවුවහොත් අවශ්‍යයෙන්ම පාරිභෝගික අතිරික්තය අඩුවීම.
- භාණ්ඩ සෙවීමට උත්සාහ දැරීම නිසා කාලයේ ආවස්ථික පිරිවැයක් හටගැනීම.

(කරුණු 2ක් දැක්වීමට ලකුණු 02යි)

ii). සලාක පත් යොදාගැනීම - පෝලිම් ක්‍රමය - අල්ලස් මගින් සලාක කිරීම
වෙනත් භාණ්ඩ සමග සම්බන්ධකොට සලාක කිරීම - කළු කඩ මිල (කරුණු 03කට ලකුණු 03කි)


iii). (අ)

60 -2Pb = 10+3(Pb+5)
60 – 2Pb = -10 +3Pb +15
60 – 5 = 5Pb
55 = 5Pb
පාරිභෝගිකයා ගෙවන මිල 11 = Pb (ලකුණු 1)

Ps = Pb + 5
Ps = 11 + 5
Ps =16 නිෂ්පාදකයාට ලැබෙන මිල (ලකුණු 1



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ආ) 


(ඉ) සමතුලිත මිළ = 14
සමකුලිත ප්‍රමාණය = 32 (ලකුණු 2)

(ඊ) නව සමතුලිත මිල = 11
නව සමතුලිත ප්‍රමාණය = 35
(නිවැරදි සහනාධාරයෙන් පසු වක්‍රයට ලකුණු 2යි. සමතුලිත මිල සහ ප්‍රමාණයට ලකුණු 2)

(උ) සහනාධාරයේ ප්‍රමාණය ලකුණු කොට පෙන්වා ඇත්නම් (ලකුණු 1)

(ඌ) නිෂ්පාදකයා ලබන වාසිය $\frac{32+35}{2} \times 2 = 67$ (ලකුණු 2)

පාරිභෝගිකයා ලබන වාසිය $\frac{32+35}{2} \times 3 = \frac{67}{2} x3 = \frac{201}{2}$
$= 100.5$ (ලකුණු 2)


05). **i. වෙළඳපොළ ව්‍යුහයන්ගේ ස්වරූප මොනවාද? (ලකුණු 4)**
**ii. පූර්ණතරඟකාරී වෙළඳපොළක විශේෂ ලක්ෂණ 04ක් ලියා දක්වන්න. (ලකුණු 4)**
**iii. කෙටිකාලයේදී ආයතනයක් විවිධවූ ලාභ ලබමින් නිෂ්පාදනයේ නිරත වේ. එම අවස්ථා 03 නම් කරන්න. (ලකුණු 3)**
**iv. වෙළඳපොළ ආර්ථිකයක ලාභය (ආර්ථික ලාභය) මගින් ඉටුකරන කාර්යයන් මොනවාද? (ලකුණු 3)**
**v. ආයතනයක් කෙටිකාලයේදී ආර්ථික ලාභ සහිතව නිෂ්පාදනයේ යෙදෙන අවස්ථාවක් කල්පිත සංඛ්‍යා යොදාගෙන රූපසටහන් ඇසුරෙන් ගණනය කොට දක්වන්න. (ලකුණු 4)**

05). i). *පූර්ණ තරඟය *ඒකාධිකාරය *ඒකාධිකාරී තරඟය *කති පයාධිකාරය (ලකුණු. 4)

ii). *ආයතන අතිවිශාල සංඛ්‍යාවක් තිබීම. *නිෂ්පාදනය සමජාතීය වීම.
*වෙළඳපොළට ප්‍රවේශ වීමට පිටවීමට බාධා නොමැතිවීම. *පූර්ණ දැනුම.
*පූර්ණ සාධක සංචලතාව. *ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වීම.
*මිල ආන්තික පිරිවැයට සමාන වීම. P=MC *පැවරුණ මිලක් යටතේ භාණ්ඩ අලෙවි කිරීම.
(කරුණු 04කට ලකුණු.4)

iii). *ආර්ථික ලාභ ලබමින් නිෂ්පාදනයේ නිරතවීම.
*ආර්ථික අලාභ සහිතව නිෂ්පාදනයේ නිරතවීම.
*ආර්ථික ලාභ ශුන්‍ය තත්වයක් යටතේ නිෂ්පාදනයේ නිරතවීම. (ලකුණු .3)

iv). *වෙළඳපොළ සංඥා සැපයීම.
*අවදානම් දැරීම වෙනුවෙන් ප්‍රතිලාභ සැපයීම.
*නව්‍යතා හඳුන්වාදීම දිරිමත් කිරීම
*ආර්ථිකයේ විවිධ නිෂ්පාධන අංශ අතර සම්පත් බෙදීයාම කාර්යක්ෂම කිරීම.
*ආයතනය ප්‍රසාරණය කිරීම සඳහා අවශ්‍ය කරන සම්පත් සපයාදීම.(ලකුණු 5)

v). 


TR = P x Q
= 20 x 50
= 1000

TR =AD x Q
= 16 x 50
= 800

ආර්ථික ලාභ = TR - TC
= 1000 - 800
= 200

(රූප සටහනට ලකුණු 02යි. ළමයා යොදාගත් සංඛ්‍යා යටතේ නිවැරදි ගණනය කිරීමට ලකුණු 02යි


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

06). **i.** **දළ දේශීය නිෂ්පාදනය හා දළ ජාතික ආදායම යන සංකල්ප පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

**ii.** **රටක ජාතික ආදායම ගණනය කිරීමේදී බැහැර කෙරෙන නමුත් පෞද්ගලික ආදායම ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සංරචකයන් කවරේද?** **(ලකුණු 2)**

**iii.** **දළ මෙහෙයුම් අතිරික්තය හා මිශ්‍ර ආදායම් යන ප්‍රාථමික ආදායම් සංරචක අතර පවත්නා වෙනස පැහැදිලි කරන්න** **(ලකුණු 4)**

**iv.** **අ)** **ආර්ථිකයක ස්වයංක්‍රීය පරිභෝජනය රු. බිලියන 400ක්ද, ආන්තික පරිභෝජන නැඹියාව (MPC) 0.8 ක්ද වේයැයි සලකන්න. වැයකළ හැකි ආදායම රු.බිලියන 5000ක් වේනම් සාමාන්‍ය ඉතුරුම් නැඹියාව හා සාමාන්‍ය පරිභෝජන නැඹියාව ගණනය කරන්න.** **(ලකුණු 4)**

**ආ)** **ඉහත ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම රු.බි. 5000ක් වේනම් ආයෝජන වියදම් වල අගය කොපමණද?** **(ලකුණු 2)**

**ඉ)** **මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම සමාහාර ආදායම් වියදම් රූපසටහනකින් ඉදිරිපත් කරන්න.** **(ලකුණු 2)**

**ඊ)** **ආයෝජන ගුණකයේ අගය කොපමණද?** **(ලකුණු 2)**

06). i). - දළ දේශීය නිෂ්පාදිතය යනු දෙන ලද කාලපරිච්ඡේදයක් තුළ ආර්ථික ප්‍රදේශය තුළ නිෂ්පාදනය කරනු ලබන සියලුම අවසාන භාණ්ඩ හා සේවාව වල මුළු වෙළඳපොළ වටිනාකමයි.
(නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ ආර්ථික ප්‍රදේශ තුල කටයුතු කරන සියලුම නේවාසික ඒකක විසින් බිහිකරන නිෂ්පාදන ක්‍රියාකාරකම් වල එකතුකළ අගයන්ගේ සමස්ත වෙළඳපොළ වටිනාකමයි.) (ලකුණු 2)

- දළ ජාතික ආදායම් යනු ආර්ථිකයක් තුළ සිටින නේවාසිකයන් විසින් වසරක් තුළ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වීමෙන් උපයන ලද සමස්ත සාධක ආදායමයි. (ලකුණු 1)
- දළ දේශීය නිෂ්පාදනයට ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් එකතු කළ විට දළ ජාතික ආදායම ලබාගනී. (ලකුණු 1)

ii. - විශ්‍රාම වැටුප් - රාජ්‍ය ණය සඳහා ගෙවනු ලබන පොළී - විදේශ ශුද්ධ පෞද්ගලික ප්‍රේෂණ
- කුටුම්බ වෙත ලැබෙන වෙනත් සංක්‍රාම - (කරුණු 1ට ලකුණු 1 බැගින් ලකුණු 2)

iii. - දළ මෙහෙයුම් අතිරික්තය යනු සමාගමික අංශයේ ව්‍යවසායකයන් විසින් ජනනය කෙරෙන ආදායමයි.
- එම අංශය නිපදවන ලද මුළු නිමැවුමේ වටිනාකමින් සියලුම පිරිවැය හා ශුද්ධ බදු අඩු කළවිට ලැබෙන ශේෂය හෙවත් පොලී, බදුකුලී, දළ ලාභ යන දේපොළ ආදායම් වල එකතුව දළ මෙහෙයුම් අතරික්තයෙන් සමන්විත වේ. (ලකුණු 2)
- මිශ්‍ර ආදායම යනු කුටම්බ විසින් කරනු ලබන ව්‍යවසායක ක්‍රියා ආශ්‍රයෙන් ජනනය වන ආදායම්වේ.
- මෙවැනි ක්‍රියාකාරකම් තුළින් බිහිවන ඉපැයීමෙන් අතරමැදි පරිභෝජනය, වැටුප් ගෙවීම්, සියලුම ශුද්ධ බදු අඩුකළ පසු ශේෂවන ප්‍රමාණය මිශ්‍ර ආදායමින් සමන්විත වේ. (ලකුණු 2)

iv. අ). $C = 400 + 0.8yd$ , $yd =$ රු.බි. 5000

$= 400 + 0.8 \times 5000$

$C = 400 + 4000$

$= \underline{\underline{4400}}$ (ලකුණු 1)

$$APC = \frac{C}{yd}$$

$$= \frac{4400}{5000}$$

$= \underline{\underline{0.88}}$ (ලකුණු 1)

$S = -400 + 0.2yd$

$= -400 + 0.2\,(5000)$

$S = \underline{\underline{600}}$ (ලකුණු 1)

$$APS = \frac{S}{yd}$$

$$= \frac{600}{5000}$$

$= \underline{\underline{0.12}}$ (ලකුණු 1)



**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

ආ). $y = C + I$


$5000 = 400 + 0.8\ (5000) + I$ (ලකුණු 1)

$5000 = 4400 + I$

$5000 - 4400 = I$

රු.බි.600 = I (ලකුණු 1)

ඉ).




(ප්‍රස්ථාරයට ලකුණු 1)

(ඊ) ආයෝජන ගුණකය (K) $= \frac{1}{1-b}$

$= \frac{1}{1-0.8} = \frac{1}{0.2} = \frac{10}{2} = \underline{\underline{5}}$ (ලකුණු 2)

**07). i. පහත සඳහන් දෑ නිෂ්පාදන ඉමට ඇතුළත්වේද? පැහැදිලි කරන්න.**

**(අ) මව විසින් තම දරුවාගේ පාසල් නිළ ඇඳුම මසා දීම**
**(ආ) නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම්**
**(ඉ) භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගෙවනු ලබන පොළිය**
**(ඊ) රජය විසින් සපයන නිදහස් අධ්‍යාපනය** **(කරුණකට ල. 1 බැගින් ල. 4)**

**ii. කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත දී ඇතැයි සලකන්න. (සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)**

| | |
|---|---|
| දළ දේශීය වියදම | 430 |
| මුළු පරිභෝජන වියදම | 360 |
| අපනයන ඉපයීම | 250 |
| ආනයන වියදම | 280 |
| විදේශීය ඉතුරුම් | 200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 50 |
| නිෂ්පාදනය මත පනවන ලද සහනාධාර අඩුකළ වෙනත් බදු | 20 |

**ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.**
**(අ) වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදනය**
**(ආ) දේශීය ඉතුරුම්**
**(ඉ) වැයකළ හැකි දළ ජාතික ආදායම**
**(ඊ) මුළු සම්පත් සංයුතිය** **(ලකුණු 2 බැගින් ල. 8)**

**iii. ස්වායක්ත ඉතුරුම් $(-a)$ හා ආන්තික ඉතුරුම් නැමියාව (MPS) යන සංකල්ප හඳුන්වන්න.** **(ලකුණු 4)**

**iv. බදු අයකිරීමක් නැති එක්තරා ආර්ථිකයක ආදායම රු1000 දී පරිභෝජන වියදම (C) රු 800 ක් වන අතර ආදායම 1500 දී පරිභෝජන වියදම රු 1175ක් වේ.**

**අ). මෙම දත්ත ඇසුරෙන් පරිභෝජන ශ්‍රිතයට අදාල සමීකරණය ව්‍යුත්පන්න කරන්න.** **(ලකුණු 2)**

**ආ). රජය මෙම ආර්ථිකයට ස්ථාවර බදු ක්‍රමයක් හඳුන්වා දී සෑම ආදායම් වට්ටමකදීම රු 20ක් බදු වශයෙන් අය කරයි නම් බදු අයකිරීමෙන් පසු පරිභෝජන ශ්‍රිතයට අදාල සමීකරණය ගොඩනගන්න.** **(ලකුණු 2)**

07). i). (අ) ඇතුළත් වේ. ගෘහය තුළ සිදුකෙරෙන භාණ්ඩ සපයා ගැනීමක් වන බැවිනි. (ලකුණු 1)

(ආ) ඇතුළත් වේ. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට අයත් සංරචකයකි. (ලකුණු 1)

(ඉ) ඇතුළත් නොවේ. සංක්‍රාමයක් වන බැවිනි. (ලකුණු 1)

(ඊ) ඇතුළත් වේ. රජයේ පරිභෝජන වියදමට අයත් සංරචකයකි. (ලකුණු 1)



**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

ii). (අ) වෙළඳපොල මිල අනුව ද.දේ. නිෂ්පාදිතය
= ද.දේශීය වියදම + ශුද්ධ අපනයන
= 430 + (250 - 280) (ලකුණු 1)
= 400 (ලකුණු 1)

(ආ) දේශීය ඉතුරුම් = I + NX)
දළ අයෝජනය = ද.දේ.වියදම - මුළු පරිභෝජන වියදම
= 430 – 360
= 70 (ලකුණු 1)

දේශීය ඉතුරුම් = I + Nx
= 70 + (-30)
= 40 (ලකුණු 1)

(ඉ) වැයකළ හැකි ද.ජා.ආදායම = ද.දේ.නිෂ්පාදිතය + විදේශීය ඉතුරුම්
= 400 + 200 (ලකුණු 1)
= 600 (ලකුණු 1)

(ඊ) මුළු සම්පත් = ද.දේ. නිෂ්පදාතිය + ආනයන
= 400 + 280 (ලකුණු 1)
= 680 (ලකුණු 1)

iii). - ආදායම් මට්ටම සමග නොබැඳුනු ඉතුරුම් ප්‍රමාණය හෙවත්, ආදායම ශුන්‍ය අගයක් ගනු ලබන විට ඇතිවිය හැකි ඉතුරුම් ප්‍රමාණය ස්වායත්ත ඉතුරුම් ලෙස හැඳින්වේ.
- ආදායම ශුන්‍ය බව විට ඉතිරි කිරීමට හැකියාවක් නොමැති බැවින් එහිදී සිදුවනුයේ අතීතයේ ඉතුරුම් කැප කිරීමයි. එවිට ඉතුරුම් (අපශේෂය) දක්නට ලැබේ. (ලකුණු 2)
- ආදායම් කිසියම් වෙනසක් $\Delta y$ නිසා ඉතුරුම් වෙනස් වන ප්‍රමාණය $\Delta s$ අනුපාතයක් හෝ ප්‍රතිශතයක් ලෙස දැක්වීම ආන්තික ඉතුරුම් නැඹියාව ලෙස හැඳින්වේ. (ලකුණු 1)
- ආන්තික ඉතුම් නැඹියාව = $\frac{\text{ඉතුරුම්වල වෙනස } \Delta s}{\text{ආදායමේ වෙනස } \Delta y}$ (ලකුණු 1)

iv). අ). MPC $= \frac{\Delta c}{\Delta y} = \frac{375}{500} = 0.75$

පරිභෝජන ශ්‍රිතය C = a + by
800 = a + 0.75 (1000)
800 – 750 = a
50 = a (ලකුණු 1)
පරිභෝජන ශ්‍රිතයට අදාළ සමීකරණය C = 50 + 0.75y (ලකුණු 1)

ආ). බද්දට පසු පරිභෝජන ශ්‍රිතයට අදාළ සමීකරණය
= 50 + 0.75 ( y – T ) (ලකුණු 1)
= 50 + 0.75 ( y – 20 )
= 50 + 0.75y - 15
= 35 + 0.75y (ලකුණු 1)

**08). i. මුදල් යනුවෙන් කුමක් අදහස්වේද? (ලකුණු 2)**
**ii. හොඳ මුදලක තිබිය යුතු ගුණාංගයක් 4ක් නම් කරන්න. (ලකුණු 4)**
**iii. මුදලේ කාර්යයන් ලෙස විනිමය මාධ්‍යයන් වීම සහ වටිනාකමේ සන්නිධියක් වීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**iv. ආසන්න මුදල් සහ ආදේශ මුදල් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**v. මූල්‍ය පදනම යනුවෙන් කුමක් අදහස්වේද? පදනම් මුදල් තීරණය කිරීම සඳහා බලපාන සාධක මොනවාද? (ලකුණු 6)**

08). i). භාණ්ඩ හා සේවා හුවරාරුවේදී සමාජයක් විසින් පුළුල් ලෙස භාවිතාකරණ පොදුවේ පිළිගනු ලබන ඕනෑම දෙයක් මුදල් ලෙස හැඳින්විය හැකිය. (ලකුණු 2)

ii) - පොදුපිළිගැනීමක් තබීම. - කල් පැවැත්ම - සමජාතීය බව - කොටස්වලට වෙනස් කිරීමේ හැකියාව
- ගෙනයාමේ පහසුව - සුලභ හෝ දුලභ නොවීම - අනුකරණය කල නොහැකිවීම
- පහසුවෙන් හඳුනාගත හැකිවීම. (කරුණු 4ට ලකුණු 4)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

iii). - විනිමය මාධ්‍යයක්වීම යනු භාණ්ඩ හුවමාරුවේදී මුදල් අතරමැදි කාර්යයන් ඉටුකිරීමයි. භාණ්ඩ මුදල් බවටත් මුදල් නැවත භාණ්ඩ බවටත් පත්කිරීම පහසු නිසා ගනුදෙනු පුළුල් විය. භාන්ඩ හුවමාරුවේ පැවැති විවිධ ගැටලු මුදල් විනිමය මාධ්‍යයන් ලෙස කටයුතු කිරීම නිසා නිරාකරණය විය. මුදල් වෙනත් වත්කම් වලින් වෙන්කර හඳුනා ගැනීම සඳහා මෙම කාර්යය වැදගත් වේ. (ලකුණු 2)

- වටිනාකමේ සන්නිධියත් වීම යනුවෙන් අදහස් කරන්නේ මුදල් වත්කම් තබාගැනීමේ පහසු මාධ්‍යයක් ලෙස කටයුතු කිරීමයි. මේ මගින් ද්‍රවශීලතා වරණය ඉටුවේ. අවධානමකින් සහ අපහසුතාවයකින් තොරව අනාගත අවශ්‍යතා සඳහා මුදල් තබාගැනීම මෙයින් අදහස් වේ. (ලකුණු 2)

iv). - ආසන්න මුදල් යනු ඉක්මනින් හා පහසුවෙන් මුදල් බවට පත්කරගත හැකි වත්කම්ය.

- වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කෙරෙන ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු වත්කම් ආසන්න මුදල් වේ.

උදා:- ඉතුරුම් තැන්පතු
ස්ථාවර තැන්පතු (ලකුණු 2)

- අදේශ මුදල් යනු වටිනාකමේ සන්නිධියන් ලෙස ක්‍රියා නොකරන තාවකාලික විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කරන මුදල් වෙනුවට භාවිතා කලහැකි ණයපත් වැනි උපකරණ වේ.

උදා:- මාස්ටර්කාඩ් (ලකුණු 2)

v). - පදනම් මුදල් යනු මහජනයා සහ වාණිජ බැංකු සතු මුදල් ප්‍රමාණයන් වාණිජ බැංකු විසින් මහබැංකුවේ තැන්පත්කල තැන්පතු ප්‍රමාණයේත් එකතුවයි. (ලකුණු 3)

- තීරණය කරන සාධක
- මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්
- මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්
- මහ බැංකුවේ වෙනත් වත්කම් (ලකුණු 3 )

**09). i. උද්ධමනය අවධමනය හා නිරුද්ධමනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 3)**

**ii. ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීම සඳහා භාවිතා කරන මිනුම් මොනවාද? (ලකුණු 3)**

**iii. මහ බැංකුවේ වත්මන් අරමුණු දෙක නම් කරන්න. (ලකුණු 2)**

**iv. මහ බැංකුවේ ණය පාලන උපකරණ මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**v. කල්පිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතියක් ඇතැයිද එයින් එක් වාණිජ බැංකුවක පුද්ගයකු රුපියල් 20000 මුදලක් තැන්පත් කලබව සිතන්න. මහබැංකුවේ සංචිත අනුපාතය 25% ක් නම්**

**(අ) මෙම බැංකුවේ අධිසංචිත ප්‍රමාණය කොපමණද?**

**(ආ) ණය ගුණකයේ අගය කොපමණද?**

**(ඇ) අධිසංචිත ණයට දුන්පසු එම ණය එම බැංකුවේම තැන්පත් කලේ නම් එම බැංකුවේ ශේෂ පත්‍රය සකස් කරන්න.**

**(ඈ) ණය මැවීම සම්පූර්ණ කලවිට බැංකු පද්ධතියේ ශේෂපත්‍රය සකස් කරන්න. (ලකුණු 8)**

09). i). - උද්ධමනය යනු කිසියම් කාලපරිච්ඡේදයක් තුල රටක සාමාන්‍ය මිල මට්ටමේ හෝ පොදුමිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාමයි.

- අවධමනය යනු පොදු මිල මට්ටමේ සිදුවන අඛණ්ඩ පහළ යාමයි.
- නිරුද්ධමනය යනු උද්ධමන අනුපාතයේ ප්‍රමාණය ක්‍රමයෙන් පහළ යාමකි. (ලකුණු 3)

ii). - කොළඹ පාරිභෝගික මිල දර්ශකය - ජාතික පාරිභෝගික මිල දර්ශකය
- නිෂ්පාදකයාගේ මිල දර්ශකය - දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනය

(කරුණු 3 සඳහාලකුණු 3)

iii) .- ආර්ථික හා මිල ස්ථායීතාවය පවත්වා ගැනීම.
- මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය පවත්වාගෙන යාම. (ලකුණු 2)

iv). - ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම
- සංචිත අනුපාතය වෙනස් කිරීම
- පොලී අනුපාතය වෙනස් තිබීම
- විවට වෙළෙඳපොළ කටයුතු

- ගුණාත්මක ණය පාලන ක්‍රම
- වර්ණාත්මක පොලී අනුපාත නියම කිරීම
- උපරිමය ණය සීමා නියම කිරීම
- යහ පෙළඹුම්
- ණයවර ලිපි කාසි ආන්තික නියම කිරීම

(ලකුණු 4)

v). (අ) අධි සංචිත = පවතින සංචිත - පවත්වාගත යුතු සංචිත

$$20000 - 20000 \times \frac{25}{100}$$

$$20000 - 5000$$

$$\underline{\underline{15000}}$$

(ලකුණු 2)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ආ) ණය ගුණක $= \frac{1}{R}$

K $= \frac{1}{\frac{25}{100}}$

K $= 1x \frac{100}{25}$

K $= 4$ (ලකුණු 2)

(ඇ)

| වගකීම් | වත්කම් |
|---|---|
| ඉ.තැ. 35000 | සංචිත 20000<br>ණය 15000 |
| 35000 | 35000 |

(ලකුණු 2

(ඈ)

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉ.තැ. | 8000 | සංචිත | 20000 |
| | | ණය | 60000 |
| | **80000** | | **80000** |

(ලකුණු 2)

10). **i.** **වෙළඳපොළ ආර්ථිකයක සම්පත් බෙදීයාම ආකාර්යක්ෂම වේ. ඒ සඳහා බලපෑ හේතු මොනවාද?** **(ලකුණු 4)**
**ii.** **බාහිරතා ප්‍රභේද 4ක් නම් කරන්න.** **(ලකුණු 4)**
**iii.** **වෙළඳපොල ආර්ථිකයක රජයේ කර්යභාරය පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**
**iv.** **බාහිරතා අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග නම් කරන්න.** **(ලකුණු 4)**
**v.** **හොඳ බදුක්‍රමයක මූලික ලක්ෂණ මොනවාද?** **(ලකුණු 4)**

10). i). - පොදු භාණ්ඩ නොසැපයීම.
- අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ථව පාරිභෝජනය නොවීම.
- ශුභ සාධක භාණ්ඩ ප්‍රශස්තව නොසැපයීම.
- සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම.
- පොදු සම්පත් අවභාවිතය.
- බාහිරතා සැලකිල්ලට නොගැනීම. (කරුණු 4 කට ලකුණු 4)

ii). - නිෂ්පාදනයේ සෘණ බාහිරතා
- නිෂ්පාදනයේ ධන බාහිරතා
- පාරිභෝජනයේ සෘණ බාහිරතා
- පාරිභෝජනයේ ධන බාහිරතා (කරුණු 4 කට ලකුණු 4)

iii). - සම්පත් කාර්‍යක්ෂමව බෙදාහැරීම.
- ආදායම් හා ධනය සාධාරණව බෙදා හැරීම.
- සාර්ව ආර්ථික ස්වායීතාවය ඇතිකරීම.
- තිරසර සංවර්ධනය (කරුණු 4 කට ලකුණු 4)

iv). - පාරිසරික බදු පැනවීම
- බලපත්‍ර නිකුත් කිරීම
- ධන බාහිරතා සඳහා සහනාධාර සැපයීම
- පෞද්ගලිකව කේවල් කිරීම
- රජය මගින් කේවල් කිරීම (කරුණු 4 කට ලකුණු 4)

v). - සාධාරණ බව
- පිරිමැසුම් බව
- පහසුව
- නිශ්චිත බව
- කාර්යක්ෂම බව
- නම්‍යතශීලී බව
- අනුකුල බව

(කරුණු 4 කට ලකුණු 4)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

GCE O/L Exam



GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00



GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00